මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசிய கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION & NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

දිනය / திகதி / Date: 2022 – 10 - 27

## ප්‍රවෘත්ති නිවේදනය

**ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රම ව්‍යාපෘතිය [Small and Medium-sized Enterprises Line of Credit (SMELoC) Project] යටතේ ආර්ථික අර්බුදය නිසා බිඳවැටුනු ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නගාසිටුවීම සඳහා ලබා දෙන කාරක ප්‍රාග්ධන ණය**

ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රම ව්‍යාපෘතිය මගින් පහත සංචරක තුන යටතේ ණය පහසුකම් ලබා දීම මේ වනවිට සිදු කරනු ලබයි.

1. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය ආයෝජන ණය. (SME Credit Line)
2. කුඩා තේ වතු හිමියන් සඳහා, තේ නව වගාව, නැවත වගාව, පැළ තවාන් පවත්වාගෙන යාම, ජල සම්පාදනය, පාළු කැපීම ආදී කටයුතු සඳහා ආයෝජන ණය ලබා දීම. (Tea Smallholder Credit Line)
3. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා කාරක ප්‍රාග්ධන ණය ලබා දීම. (Emergency Response Facility)

ආර්ථික අර්බුදය නිසා බලපෑමට ලක්වූ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධනය සඳහා පවතින ඉහළ ඉල්ලුම සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා රජය ආසියානු සංවර්ධන බැංකුවෙන් ඒ සඳහා සහන පොලී ණය මුදලක් ඉල්ලා සිටින ලදී. රටේ පවතින වර්තමාන තත්ත්වය හේතුවෙන් නව ණය මුදලක් ලබාදීමට පවතින තාක්ෂණික බාධාවන් සැලකිල්ලට ගනිමින් නව ණය මුදලක් ලබා දෙන තෙක් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමයේ (Small and Medium-sized Enterprises Line of Credit (SMELoC) Project) දැනට භාවිතයට නොගත් ඇ.ඩො. මිලියන 13.5 ක මුදල, පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් දැඩි බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නැවත නඟා සිටුවීම සඳහා ඔවුන්ට අවශ්‍ය කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ලීම සඳහා අවශ්‍ය ණය ලබා දීම සඳහා යොදා ගැනීමට මුදල් අමාත්‍යාංශය, ආසියානු සංවර්ධන බැංකුව සමඟ එකඟත්වයකට පැමිණෙන ලදී.

ඒ අනුව, ඇ.ඩො. මිලියන 13.5 ක්, එනම් රු. මිලියන 4,900 ක් පහත සඳහන් සහභාගීත්ව මූල්‍ය ආයතන අට (08) සඳහා එක් බැංකුවකට රු. මිලියන 612 බැගින් 2022.10.05 දින සිට ලබා දුන් අතර සුළු හා මධ්‍ය

පරිමාණ ව්‍යවසායකයින්ට පහත සඳහන් බැංකු වෙතින් කාරක ප්‍රාග්ධන ණය මෙම ණය යෝජනා ක්‍රමය යටතේ මේ වනවිට ලබා ගත හැක.

**සහභාගී වන මූල්‍ය ආයතන :** පහත සඳහන් බැංකු ආයතන 08 ක් මඟින් මෙම ණය පහසුකම සපයනු ලැබේ.

1. ලංකා බැංකුව
2. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
3. හැටන් නැෂනල් බැංකුව
4. කොමර්ෂල් බැංකුව
5. සෙලාන් බැංකුව
6. ජාතික සංවර්ධන බැංකුව
7. නේෂන්ස් ට්‍රස්ට් බැංකුව

8 සම්පත් බැංකුව

**ණය ලබා දීමට අපේක්ෂිත අංශ :** ඒ අනුව, කෘෂිකාර්මික හා සංචාරක යන ක්ෂේත්‍ර සහ අපනයන-අභිමුඛ ක්ෂේත්‍රයන්ට අදාලව නිෂ්පාදන කටයුතු වල නිරත වන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයිනේග් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය සහය ලබා දීමට බලාපොරොත්තු වන අතර එමගින් රටට වැඩි විදේශ විනිමය ප්‍රමාණයක් ඉපයීමට අපේක්ෂා කෙරේ.

**ණය යෝජනාක්‍රමයේ ප්‍රධාන කොන්දේසි :** ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට මෙම ණය යෝජනා ක්‍රමය මඟින් කාරක ප්‍රාග්ධන ණය ලබා ගත හැකි අතර එක් ආයතනයකට ලබාගත හැකි උපරිම ණය මුදල රු. මිලියන 10 ක් වේ. එම ණය මුදල් උපරිම මාස හයක (06) ක ණය සහන කාලයක් (grace period) සහිතව උපරිම වසර තුනකින් (03) ගෙවීමට හැක.

**පොලී අනුපාතිකය :** වර්තමානයේ කාරක ප්‍රාග්ධන ණය සඳහා වෙළඳපොල පොළී අනුපාතිකය 20% - 25% ක් වැනි ඉහල මට්ටමක පැවතිය ද මෙම ණය යෝජනා ක්‍රමය යටතේ 11% - 12% ත් අතර අඩු පොලී අනුපාතිකයකට ණය ලබා ගැනීමට හැකිවීම ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට ලැබෙන විශාල සහනයකි.

- **මාධ්‍ය ඒකකය**